ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2015

NIOSH

National Institute of Occupational Safety and Health • Sri Lanka

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**ගරු. ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න**

අමාත්‍යතුමා - කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය

**ගරු රවීන්ද්‍ර සමරවීර**

රාජ්‍ය අමාත්‍ය - කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය

**එස්.එම්.ජී. ජයරත්න**

ලේකම්, කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය

සභාපති, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**වෛද්‍ය එන්.සී. අමරසිංහ**

අධ්‍යක්ෂ ජනරාල්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**විගණන කමිටුව**

**වෛද්‍ය එන්.සී.අමරසිංහ** - අධ්‍යක්ෂ ජනරාල්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**පී.එම්.කේ. හෙට්ටිආරච්චි** - සභාපති, අධ්‍යක්ෂ, මුදල් අමාත්‍යාංශය

**ඩබ්ලිව්.ඩී.බී.ජේ.වැලිවත්ත** - නිරික්ෂක, විගණන අධිකාරි, විගණකාධිපති දෙපාර්තමේන්තුව

**එම්.ආර්.ජී.ඒ.බී.මුතුකුඩේ** - අභ්‍යන්තර විගණක, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

**පී.එම්.කේ.පෙරේරා** - සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

බැංකුව - මහජන බැංකුව - නාරාහේන්පිට

## පටුන ........................................


පිටුව

01 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිළිබඳ හැඳින්වීම 04

02 දැක්ම, මෙහෙවර, අරමුණු 05

03 කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමාගේ පණිවුඩය 06

04 ලේකම්තුමාගේ පණිවුඩය 07

05 අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය 08-09

06 අධ්‍යක්ෂ මණ්ඩලය ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 10-12

07 සංවිධාන ව්‍යුහය 13

08 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් 14

09 2015 වර්ෂයේ පැවැත්වූ පාඨමාලා , වැඩමුළු හා සම්මන්ත්‍රණ

- **පාඨමාලා**
  - වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 15
  - වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 16
  - කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම. 16
- වැඩමුළු
  - රෝග නිර්ණ කඳවුර - අපනයන සැකසුම් වෙළඳ කලාපය 17
  - බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම 17
- **සම්මන්ත්‍රණ**
  - ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය 17
  - ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන - මැජෙස්ටික් සිටි 19
  - මාධ්‍ය හමුව හා සේවය අතරතුර අත්පා අහිමි වූ සේවකයන් නැවත සමාජගත කිරීමේ ව්‍යාපෘතිය 19
  - විශ්වවිද්‍යාල සිසුන් සඳහා සුරක්ෂිතතා හා සෞඛ්‍ය වැඩමුළුව 20
  - ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය 21
- **ඩිප්ලෝමා සහතිකපත් ප්‍රධානෝත්සවය 22**
  - ජපානයේ ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වෘත්තිකයින් පුහුණු කිරීමේ වැඩසටහන 23
- **වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ සමීක්ෂණය 23**
- **වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය කළමනාකරණ පද්ධති පිළිබඳ කර්මාන්තයන් සඳහා උපදේශන සේවා 23**
- **උපකරණ නිවැරදිව භාවිතය පිළිබඳව උපදේශන සේවාව සැපයීම 24**

- **දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් 25**
- **2015 ඵලදායිතා සම්මාන සඳහා සූදානම් වීම 25**
    - ➢ 2011 වසරේ සිට 2015 දක්වා NIOSH ප්‍රගතිය 26
- **වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ අධ්‍යයනය සඳහා වූ පුස්තකාලය 28**
- **ආයතනයේ මූල්‍ය ප්‍රගතිය 29**
- **ගිණුම්වලට අදාළ සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති 30**
- **දේපළ පිරියත හා උපකරණ 33**

10 විගණකාධිපති වාර්තාව 34

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

## හැඳින්වීම

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිලිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදි. මෙරට තුල මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැළකීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් පිළිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්ත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබාදීමට අප ආයතනය නිරතුරුවම කැපවී සිටින අතර මෙවැනි පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක සේව්‍යය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනයද අප විසින් ලබාදෙනු ලබයි.

ආයතනයක් ලෙස අප ඉහත කාර්යන් සියල්ලක්ම ඉතාමත් සාර්ථක ලෙස ඉටු කරමින් අපගේ පාරිභෝගික ජනතාව හට ඉහල තෘප්තියක් මෙන්ම වඩා ඵලදායි සේවාවන් ලබාදෙන බවට ඉතාමත් සතුටින් දැනුම් දීමට කැමැත්තෙමු. ඒ පිලිබඳව වඩාත් සතුටු විය හැකි ප්‍රබල හේතුව වන්නේ මෙම ආයතනය ආරම්භ කර ඉතාමත් කෙටි කලකදි වුවද ලබා ඇති දියුණුවේ ප්‍රගතිය දෙස බැලීමේදීය. එසේම මේ වන විට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයෙන් නිරතුරුවම සේවා ලබාගන්නා ආයතන ප්‍රමාණය දෙස බලා කරන ලද පසු විපරම තුළින් මෙය වඩාත් ඔප්පු කර ගත හැකි වනු ඇත.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයට ඉතාම කෙටි කාලයකින් මෙරට අපනයන සැකසුම් කලාපයේ පිහිටුවා ඇති බොහෝ කාර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩි මනක් ආනයන අපනයන සමාගම් සමඟ මෙන්ම නිෂ්පාදන ක්ෂේත්‍රයේ සමාගම් හා වැවිලි ක්ෂේත්‍රයේ සමාගම් සමඟ අපගේ සේවා කටයුතු සිදු කරමින් ඉතා වටිනා කාර්යයභාරයක් ඉටු කර ඇත. එම ආයතනයන් සමඟ එක්ව ඒ ඒ ආයතනවල වැඩ කරන සේවකයන්ගේ ආරක්ෂාවට හා සෞඛ්‍ය ආරක්ෂා කිරීම උදෙසා විවිධ වැඩසටහන්, දැනුවත් කිරීම් රාශියක් පසුගිය කාලයන්හි සිදු කොට ඇත්තෙමු. මෙම වසරේදීද අපගේ සේවා කටයුතු ඉහල මට්ටමකට ගෙන ඒමට මහත් කැපවීමෙන් කටයුතු කළ අතර ඒ පිලිබඳව හා මෙම වසර තුල අපගේ සේවාවන් පිලිබඳ සමාලෝචනය මෙහි ඇතුලත්වේ.

**දැක්ම :-** *"සැමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍ය හා සුභසාධනය ලබාදීම"*

**මෙහෙවර :-** *" සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සහතික කරලීම සහ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා සියළු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින් ත්‍රෛයිපාර්ශවීය කොටස් කරුවන් සවිබලගැන්වීම"*

**කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශයේ**
**අමාත්‍යතුමාගේ පණිවුඩය**



කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ පවත්නා අයවැය කාරක සභා විවාදයේදී ඔබ අතට පත්කරන මාගේ අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් ශ්‍රී ලංකා සේව්‍ය, සේවක පක්ෂ වෙත ඉටුකරන ලද සේවාවන් හා එහි ප්‍රගතිය දැක්වෙන මෙම වාර්තාව සඳහා කම්කරු විෂයභාර අමාත්‍යවරයා ලෙස පණිවිඩය නිකුත්කරන්නට ලැබීම මා භාගයක් කොට සලකමි.

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මගින් සපයනු ලබන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තොරතුරු, අධ්‍යාපනය හා පුහුණුව සැපයීම මගින් ආරක්ෂාකාරී සෞඛ්‍ය සම්පන්න සේවා තත්ත්වයක් සහතික කරනු ලබයි. එමෙන්ම තොරතුරු රැස් කිරීම, විද්‍යාත්මක පර්යේෂණ සඳහා සහයෝගය දැක්වීම මා විසින් අගය කොට සලකමි. එමෙන්ම කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මගින් සේවා යෝජකයන් සහ කලමණාකරණය අවධානම් අඩු වැඩබිමක් නිර්මාණය කිරීමට සහ අවධානම් රහිත සේවා වැඩබිමක් නිර්මාණය කිරීමට අවශ්‍ය ප්‍රායෝගික දැනුම ලබාදීම සුරක්ෂිතතා ආයතනය මගින් සිදුකරන්නේය. එය මා විසින් අගය කරන්නෙමි. එමෙන්ම වැඩකරන ජනතාවගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ඉහළ නැංවීමට සිදු කරන විවිධාකාරි වූ වැඩසටහන් මා විසින් අගය කරන්නෙමි.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය තුලින් නිරෝගී සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් බිහිකිරීම සඳහා කැපවී කටයුතු කල බව පසුගිය කාලපරිච්ඡේදය තුල සිදුකළ ක්‍රියාකාරකම් තුලින් මනාව පැහැදිලි වේ. වෘත්තීය සුරක්ෂිතතා පරිසරයක් බිහිකිරීම උදෙසා ආයතනය විසින් කැපකළ ශක්තිය මා විසින් අගය කරන්නෙමි. මෙම සියලු කාර්යයන් තුළින් අප ආයතනය රටේ ඵලදායිතාවය වර්ධනය කිරීමේ දායකත්වයක් සපයා තිබේ.

මෙම කාර්යය සාක්සාත් කරගැනීමට කැපවීමෙන් සහ සහයෝගයෙන් කටයුතු කළ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඇතළු සියලු ආයතන ප්‍රධානීන්ටත් එම ආයතනවල සියලු කාර්යය මණ්ඩල නිළධාරින්ටත් මාගේ ස්තූතිය පුදකර සිටිමි.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අභිවෘද්ධිය උදෙසා අනුපමේය මෙහෙයක් ඉටුකරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු සියලුම කාර්යය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුදකර සිටිමි.

**ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න**
**අමාත්‍ය කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය**

**කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය.**



2016 වර්ෂයේ කම්කරු හා කම්කරු සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යාංශ අයවැය පිළිබඳ කාරක සභා අවස්ථා විවාදයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත්කිරීම සඳහා පිළියෙල කරන ලද, මෙම අමාත්‍යාංශ හා ඒ යටතට අයත් වූ ආයතන 2015 වර්ෂයේ දී ලබාගත් ප්‍රගතිය පිළිබඳව වාර්තා මෙම ප්‍රකාශනය මගින් ඔබ අතට පත් කිරීමට ලැබීම මා ලද භාගයක් කොට සලකමි.

තාපකරණ, විදුලි සැර වැදීම, මාරක රිය අනතුරු, ගෑස් පිපිරිම්, අනාරක්ෂිත ඉදිකිරිම් ආදියෙන් පැයකට එක් මරණයක් ශ්‍රී ලංකාව තුළ වර්තමානය වන විට වාර්තාවේ. අනතුරු ඇගවීමට මා මෙන්ම ඔබ ද කැමති නැත. අනතුරු ඇගවිය යුත්තේ අප අනාරක්ෂිත කටයුත්තක යෙදෙන නිසාවෙනි. එබැවින් නිරෝගි සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් බිහිකිරීම ජාතික වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතා ආයතනය කැපවී තිබේ. ශ්‍රී ලංකාව තුළ තම වෘත්තීය නිසා තම ජිවිතය සදහටම අහිමිකරගන්නා පිරිස් සිටි. එසේත් නැතහොත් අනතුරකට ලක් වී ජිවිත කාලයම අබාධිත තත්ත්වයට ලක්වන පිරිස් ද වැඩි වශයෙන් දැකිය හැක. එයට හේතුව වන්නේ ආරක්ෂාව ගැන නොසිතන නිසාවෙනි.

ආරක්ෂාව ප්‍රධාන වේ. ආරක්ෂාව පළමුව සිතා ආලාභ පාලනය කිරීම, කාලය නිෂ්පාදනය පිළිබදව අවධානය යොමු කළ යුතුය. ශ්‍රී ලංකා ශ්‍රම බලකායට නියම වෘත්තීය ආරක්ෂක ප්‍රමිතින් නිසියාකාරව සන්නිවේදනය කිරීමේ ප්‍රධාන ආයතනයක් ලෙස අප පැසදිය යුතුය. එනම් අධ්‍යාපන පුහුණුව හා දැනුවත් කිරිම් වැනි කාර්යයන් තුළින් රටේ ඵලදායිතාවය වර්ධනය කිරීමේ කර්තව්‍යයට දායකත්වයක් සපයා තිබේ.සේවක සුරක්ෂිතතාවයේ දැනුවත්භාවය ඉහළ නැංවීමට ඔබ ආයතනයේ කැපවීම පිළිබදව නිරන්තරයෙන් සිහිපත් කිරීමට කැමැත්තෙමි. ශ්‍රී ලංකාව තුළ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය ලෙස කටයුතු කරන ඔබගේ සේවය අගය කොට සලකමි.

මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍යවන නායකත්වය නිවැරදි මාර්ගෝපදේශකත්වය සහ අනුග්‍රාහය ලබාදුන් කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍ය ගරු ඩබ්. ඩී. ජේ. ජෝන් සෙනවිරත්න මැතිදුන්ටත් මාගේ ගෞරව පූර්වක කෘතඥතාවය පුද කරන්නෙමි.එමෙන්ම මෙම කාර්යසාධනය අත්කරගැනීමට කැපවීමෙන් සහ සහයෝගයෙන් කටයුතු කළ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඇතුළු සියලු ආයතන ප්‍රධානින්ටත් එම ආයතනවල සියලු කාර්ය මණ්ඩල නිලධාරින්ටත් මාගේ ස්තූතිය පුදකරමි.

එමෙන්ම ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආතනයේ අභිවෘද්ධිය උදෙසා අනුපමේය මෙහෙයක් ඉටුකළ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂක ජනරාල්තුමිය ඇතුළු සියලු කාර්යමණ්ඩලයට මාගේ කෘතඥතාවය පුදකර සිටිමි.

**එස්.එම්.ජී. ජයරත්න**
**ලේකම්**
**කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය**

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ**
**අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය**



අතිශය වැදගත්, කාලීන සමාජ වගකීමක් ඉටුකරන වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනයේ ඉලක්කය වනුයේ ස්වයං මූල්‍ය සම්පාදිත ආයතනයක් ලෙස අපක්ෂපාතිව ජාත්‍යන්තර මට්ටමින් වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සේවා සැපයීම මෙන්ම ආරක්ෂාකාරී ලෙස සෞඛ්‍යයට හිතකර පොදු ජන සේවාව උදෙසා තව දුරටත් තම සේවාවන් ඵලදායිව, කාර්යක්ෂමව ඉදිරියට ගෙන යැමට අවශ්‍යය සෞඛ්‍යයට හිතකර වැඩ පරිසරයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමය.

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය තොරතුරු අපගේ අනුග්‍රාහක භවතුන් වෙත බෙදා හැරීම අපගේ ප්‍රධාන වගකීම වන අතර නවතම තොරතුරු සහ දැනුම බෙදා හදා ගැනීමෙහිලා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පෙරමුණගෙන කටයුතු කරනු ලබයි.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ කාර්යය භාර්යයන් අතර,

- උසස් අධ්‍යාපනයක් ලබා දී වෘත්තීය රෝග අවධානම අඩු කිරීම
- ව්‍යාපාර ක්‍රියාකරුවන් හා සේවකයින්ගේ ධාරිතාව අනුව ඉහළ කළමනාකාරිත්වයෙන් යුතු සෞඛ්‍ය සුරක්ෂිතතාවය
- වෘත්තීය රෝගාබාධ වැඩිවීම වළක්වා ගැනීම
- රැකියාවේ නිරතවන මොහොතේ දීම වෘත්තීය අනතුරු වැලකීම
- වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ප්‍රතිඵල කෙරෙහි බලපෑම් කිරීම
- පාසල් මට්ටමින් තොරාගත් පිරිස් සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම
- වෛද්‍ය පහසුකම් ලබාදීම
- නැවත ආරක්ෂිතව රැකියාවේ නිරත වීම
- රැකියා කරන ස්ථානවල පාරිසරික මිනුම් ලබාදීම

රැකියාවේ යෙදී සිටියදී සේවාදායකින්ගේ ආරක්ෂාව හා සෞඛ්‍ය වැඩකරන ස්ථානයේ සිටින අනෙකුත් අයගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අප ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා බෙහෙවින් වැදගත් වනු ඇත. ඒ අනුව මෙම පාඨමාලාව හදාරන්නන් හට මොවුන්ගේ රැකියා හෝ සේවා ස්ථානයේ ඇති විශේෂිත අනතුරු හඳුනාගැනීමට හැකියාව ලැබෙන අතර අවධානම් සහිත ස්ථාන පිළිබඳව හඳුනාගැනීමෙන් පසු සේවා ස්ථානය අන්තරායකාරි අවස්ථාවන්ගෙන් තොරව තබාගැනීමට හැකියාව සැලසේ. ඒ නිසාම වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳව අවධානයෙන් කටයුතු කරන නිසා තම සේවා ස්ථානයේ තිබෙන යන්ත්‍රෝපකරණ පිළිබඳව නිතර විමසිල්ලෙන් කටයුතු කිරීම සිදු කළ යුතුය. මෙම සියල්ලට අවශ්‍ය පුහුණුව අප ආයතනයෙන් ලබාදෙන අතර ඉහළ කළමනාකාරිත්වයකින් යුක්ත අධ්‍යාපනයක් ලබාදීම සිදුකරනු ලැබේ.

සුරක්ෂිතතාව පිළිබඳව අපගේ අවධානයේ වැඩිවීමත් සමග අනතුරුදායක පරිසරයෙන් මිදීමට හැකියාව සැලසේන අතර සුරක්ෂිත පරිසරයක් ඇතිවේ. එය අපගේ රටට ප්‍රධාන අවශ්‍යතාවයක් වේ. ඒ අනුව සියල්ල සැලසුම් සහගත බැවින් ගමන් භාණ්ඩ හා ආරක්ෂක උපකරණ භාවිත කිරීම සඳහා අවශ්‍ය වන පරිදි කටයුතු සූදානම් කිරීම සිදු කරනු ලැබේ.

බොහෝමයක් රටවල අපට දක්නට ලැබෙනුයේ කම්කරුවන් වැඩි වශයෙන් වැඩකර වෙහෙසට පත්වීමත් සමග ඔවුන් සේවයෙන් නෙරපා හැරීමය. නමුත් ඔවුන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය පිළිබඳව අවධානය යොමු කිරීමෙන් පසු ඔවුන්ට තම රාජකාරී කටයුතු පහසුවෙන් සුරක්ෂිතව කටයුතු කළ හැකි අතර නිසි

විවේකය ලබාගැනීමෙන් පසු අසනීප තත්ත්වයට ගොදුරු වීම අඩුවීමත්, බාහිර තුවාල ඇතිවීම අඩුවීමත් මගින් යහපත් සෞඛ්‍යයෙන් යුක්තව තම රාජකාරී කටයුතු සිදු කිරීමට හැකියාව සැලසේ.

නිවැරදිව යන්ත්‍ර හා මෙවලම් භාවිත කිරීම පිළිබඳව අප පාඨමාලා තුළින් මූලික වශයෙන් ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලැබේ. එබැවින් රැකියා ස්ථානයේ අවධානම් සහගත තත්ත්වය පහවී සුරක්ෂිත වැඩ පරිසරයක් තුල සතුටින් රැකියාවල නිරතවන වෘත්තිකයන් බිහිවීම අප ආයතනයේ බලාපොරොත්තුව වේ.

**වෛද්‍ය එන්.සී අමරසිංහ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

## අධ්‍යක්ෂ මණ්ඩලය
## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්



**සභාපති**

එස්.එම්. ජී. ජයරත්න මහතා
ලේකම් ,
කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය

# සාමාජිකයින්



චාන්දනි අමරතුංග මිය
කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව



වෛද්‍යා එන්.සි. අමරසිංහ මිය
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

-
රෝහිත ප්‍රනාන්දු මයා
කොමසාරිස් - කාර්මික සුවස්ථතා අංශය
කම්කරු දෙපාර්තමේන්තුව



ආචාර්ය අජිත් ද අල්විස් මයා
මහාචාර්ය - රසායනික ඉංජිනේරු පීඨය
මොරටුව විශ්ව විද්‍යාලය



වෛද්‍ය ඉනෝකා සුරවීර
ප්‍රජා විශේෂඥ වෛද්‍ය
සෞඛ්‍ය අමාත්‍යාංශය



ආචාර්ය ඩබ්ලිව් බී. විජේරත්න මයා
ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශය



පි.එම්.කේ. හෙට්ටිආරච්චි මයා
අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යාංශය

එච්.එන්.පි. හෙට්ටිකන්දගේ මයා

ඩබ්.ඩී.පි. බී. වන්නිආරච්චි මයා

ඩී.එම්.ජී.බී. දිසානායක මයා

ඩබ්.ඒ. ඩී. වී. කුමාර වීරසිංහ මයා

එච්. අයි. රූපසිංහ මයා

ඩී.ඩී. එස්.කේ. දසනායක මයා

පි.බී. මල්ලවආරච්චි මය

## සංවිධාන ව්‍යුහය


අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ(සෞඛ්‍ය හා සුවස්ථතා)
අධ්‍යක්ෂ(සුරක්ෂිත තා)
සහකාර අධ්‍යක්ෂ (සෞඛ්‍ය)
සහකාර අධ්‍යක්ෂ (ස්වස්ථතා)
සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිලධාරි
වෘත්තීය සුරක්ෂිතතා නිළධාරි
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
සහකාර අධ්‍යක්ෂ (සිවිල්)
සහකාර අධ්‍යක්ෂ කාර්මික
සහකාර අධ්‍යක්ෂ (ඉලෙක්ට්‍රිකල් හා ඉලෙක්ට්‍රොනික්)
නීති සම්පාදක නිළධාරි
පුස්තකාලාධිපති
සම්බන්ධීකරණ නිලධාරි
කලමණාකරණ සහකාර තාක්ෂණිකl (2)
රියදුරු(2)
කාර්යාල සහයක (3)
කලමණාකරණ සහකාර තාක්ෂණික නොවන (8)

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම්.

- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය
- බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම
- කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යාන වැඩසටහන
- කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම
- කාර්යාලයීය කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය වැඩමුළු
- පරික්ෂණාගාරවල වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිලිබඳ වැඩමුළු
- රසායනික ද්‍රව්‍ය ආරක්ෂා සහිතව පරිහරණය කිරීම
- ආහාර පරිහරණය කරන්නන් සඳහා සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිලිබඳ වැඩමුළු
- ආතති කළමණාකරන පුහුණු වැඩසටහන
- පාරිසරික සමීක්ෂණ
  - වාතයේ තත්ත්වය සමික්ෂණය කිරීම සඳහා Indoor Air Quality හා දුම් පරික්ෂා කිරීම සඳහා Flu Gas Analyzer meter උපකරණය භාවිතා කිරීම
  - කර්මාන්තය තුළ දූවිලි මට්ටම් සමීක්ෂණය කිරීම හා දූවිලි පොම්ප උපකරණ භාවිතා කිරීම.
  - ඝෝෂා මට්ටම සමීක්ෂණය කිරීම හා ශබ්ද මැනීමට Sound Level Meter උපකරණය භාවිතා කිරීම.
  - උෂ්ණත්ව මට්ටම සමීක්ෂණය කිරීම හා Heat Stress Meter (තාප ආතති) දර්ශකය භාවිතා කිරීම.
- වෛද්‍ය පරික්ෂණ
  - ශ්‍රවණ තත්ත්වය මැනීමේ පරික්ෂණ
  - රුධිර විශ්ලේෂණය
  - කර්මාන්තශාලා සේවකයින්ගේ වැඩ කිරීමට යෝග්‍යතාව තක්සේරු කිරීම
  - පෙනහළු ක්‍රියාකාරිත්වය පිලිබඳ පරික්ෂණ
  - දෘෂ්ටි පරික්ෂණ

## 2015 වර්ෂයේ පැවැත්වූ පාඨමාලා, වැඩමුළු හා සම්මන්ත්‍රණ

### වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ( කාලය වසරකි)

වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් දෙකක් මෙම වසරේදී ද පවත්වන ලදි. එම පාඨමාලාවන් 2015 පෙබරවාරි හා මාර්තු මසයන්හිදි පාඨමාලා අංක 8, 9 සඳහා නව අයදුම්කරුවන් බඳවාගැනීමත් සිදු කරන ලදි. මේ සඳහා විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් විධායක නිලධාරින් පිලිවෙලින් 34 ක් හා 37 ක් වන පරිදි සහභාගි විය.

අප විසින් මෙම පාඨමාලාව සඳහා න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුම ලබාදෙන අතර ඒ සඳහා එම කණ්ඩායම් ක්ෂේත්‍ර චාරිකාවන් දෙකක් සඳහාද සහභාගි කරවීම මෙම පාඨමාලාවේ තවත් අංගයකි. ඒ සඳහා මෙම වසරේ පෙබරවාරි මස ආරම්භක පාඨමාලාවේ සිසුන් කොළඹ ඩොක්යාර්ඩ් ආයතනයට සහ බියගම කොකාකෝලා ආයතනයට ක්ෂේත්‍ර චාරිකාව සඳහා යොදාගන්නා ලදි.

පාඨමාලාව හැදෑරීම තුලින් ලද පුහුණුවෙන් තම සේවා ස්ථානයන්වල වඩාත් සුරක්ෂිත වැඩබිමක් නිර්මාණය කර ගැනීමට ඔවුන්ට හැකියාවක් ලැබෙන අතර මෙම පුහුණුව ඒ තුළින් වැඩකරන සේවකයන්ගේ ආරක්ෂාවට මනා පිටුවහලක් වී ඇත.

එසේම වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් ලෙස විවිධ ක්ෂේත්‍රයන්ට මහඟු දායකත්වයක් ලබාදීමට හැකි පිරිසක් අප ආයතනය තුළින් බිහිකර ඇත. එසේම මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු විදේශිය රැකියා වලට යොමුවීම සඳහා සුදුසුකමක් වන අතර මේ වන විටත් පාඨමාලාව සාර්ථකව නිමකළ සිසුන් විදේශීය රටවල සේවා නියුක්තව සිටියි.පාඨමාලාවන් සාර්ථක ලෙස නිම කරන සිසුන් සඳහා NVQ 6 සුදුසුකම් සහිත සහතිකපතක් ද ලබාදෙනු ඇත.





### ✦ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (කාලය මාස 3 කි)

2015 වර්ෂයේදි වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවන් දෙකක් පවත්වන්නට යෙදුනි. මෙම එක් පාඨමාලාවක කාලසීමාව සති 15කි. මෙහි එක් පාඨමාලාවක් සඳහා සිසුන් 25 දෙනෙකු සහභාගි වූ අතර අනෙක් කණ්ඩායම සඳහා සිසුන් 29 දෙනෙකු සහභාගි වන ලදි.

ඔවුන් සියළුදෙනාම සාර්ථක ලෙස පාඨමාලාව නිම කරන ලද අතර මේ තුළින් මෙම පුහුණු නිළධාරින්ගේ සේවා ස්ථාන තුල වෘත්තීය අනතුරු අවම කර ගැනීමට පිටුවහලක් වී ඇත. මේ වනවිට වැඩි ප්‍රමාණයක් සුරක්ෂිතතා නිළධාරින් ලෙස දැනට සේවයේ යෙදී සිටිති.






### ✦ කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් සඳහා වූ සහතිකපත්‍ර පාඨමාලාව

මෙරට වැඩකරන ජනතාවගේ සුරක්ෂිතතාවය වෙනුවෙන්ම ස්ථාපිත කරන ලද කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ පවතින ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මහින්ද මෙරට වෙසෙන වැඩකරන ජනතාවගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳව සොයාබලා වැඩකරන ආයතනයක් ලෙස මේ වන විට ප්‍රචලිත වෙමින් පවතී. එබැවින් අප ආයතනය නිෂ්පාදන, ඇඟළුම්, වැවිලි ක්ෂේත්‍රයන් පිළිබඳව පවත්වන පාඨමාලා මෙන්ම නිතරම රෝගීන් හා ගැටෙන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉතා වැදගත් කාර්යයභාරයක් ඉටු කරන කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙද වෘත්තිකයන් සඳහාද පාඨමාලාවක් ආරම්භ කරන්නට අප තීරණය කරන ලදි. එහි පළමු කණ්ඩායම පසුගිය වසරේදි සාර්ථකව මෙම පාඨමාලාව අවසන් කරන ලද අතර 2015 වර්ෂයේදි එනම් මෙම වසරේදි 02 වන කණ්ඩායමද බඳවාගන්නා ලදි. 2015 ජුලි මස සිට ආරම්භ කරන ලද මේ සඳහා එම ක්ෂේත්‍රය නියෝජනය කරමින් හෙදියන් 07 දෙනෙකුගේ සහභාගිත්වය තිබූ අතර සති 05ක කාලසීමාවකින් පසුව 02 වන කණ්ඩායමද සාර්ථක ලෙස පාඨමාලාව අවසන් කරන ලදි.

✦ **රෝග නිර්ණ කඳවුරු - අපනයන සැකසුම් වෙළඳ කලාපය**

- අවිස්සාවේල්ල **අපනයන සැකසුම් වෙළඳ කලාපය / කටුනායක අපනයන සැකසුම් වෙළඳ කලාපය**

අවිස්සාවේල්ල අපනයන සැකසුම් කලාපයේ හා කටුනායක අපනයන සැකසුම් කලාපයේ 2015 වර්ෂයේදි ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් රෝග නිර්ණ කඳවුරු පවත්වන ලදී.

✦ **<u>මෙම වසරේ පවත්වන ලද පුහුණු වැඩමුළු</u>**

**a. බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම**

කර්මාන්තශාලාවන්හි බොයිලේරු ක්‍රියාකරවන්නන් හා ඊට සම්බන්ධ අනෙකුත් නිළධාරින්ගෙන් සමන්විත 07 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා ඔවුන්ගේ වෘත්තීය සුරක්ෂිතතාව ඉහළ නැංවීමේ අරමුණින් 2015 අගෝස්තු දින 3 ක වැඩමුළුවක් ලෙස මෙය පවත්වන ලදි. මෙහිදී බොයිලේරු ක්‍රියාකරවීම හා භාවිතය පිලිබඳව න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුමද ඉතා පුළුල් ලෙස ලබාදෙමින් ඔවුන්ව දැනුවත් කරන ලදි. පිලියන්දල ප්‍රදේශයේ පිහිටි ඉලෙස්ටොමැටික් පුද් සමාගම වෙත ගොස් ප්‍රායෝගික පුහුණුවද ලබාදෙන ලදි.

## <u>ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය</u>

කැබිනට් මණ්ඩලය මඟින් සෑම වර්ෂයකම ඔක්තොම්බර් මස 2 වන සතිය රැකියාවල නියුක්ත වෘත්තිකයන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය ප්‍රකාශයට පත් කොට ඇත.

අරමුණු

මෙවර ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය 2015 ඔක්තොම්බර් මස 07 වන දින සිට ඔක්තොම්බර් මස 14 වන දින දක්වා පැවැත්වු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් ඇතුළුව විවිධ ක්‍රියාකාරකම් හා දැනුවත් කිරීමේ වැඩ සටහන් දිවයින පුරා පැවැත්විණි .



තේමාව :- වැඩබිම් ස්ථානවල දී සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම




විද්‍යුත් දැන්වීම්



## ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන - මැජෙස්ටික් සිටි – 2015 ඔක්තෝම්බර් 10

ජාතික වෘත්තිය සුරක්ෂිතතා සතියෙහි ආරම්භක දිනයේදි වෘත්තිය සුරක්ෂිතතාව පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ලෙස මැජෙස්ටික් සිටියෙහිදි ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය හා ඔක්සිපියුරා ආයතනයත් හොල්සිම් ආයතනයෙහිත් මුල්‍යමය දායකත්වයෙන් ඔක්තෝබර් මස 10 වන දිනය පුරා පවත්වන්නට යෙදුනි.මෙහිදි ආකර්ශනීය වැඩසටහන් රාශියක්ද එහි පැමිණෙන ලොකු කුඩා සියළුදෙනා වෙනුවෙන් පවත්වන්නටත් ත්‍යාගයන් පිරිනමමින් ඔවුන්ව අපගේ වැඩසටහන තුල රඳවාගනිමින් ආකර්ශණිය හා සාර්ථක වැඩසටහනක් ලෙස පැවැත්වීමට අපහට හැකිවිය.

- මෙහිදි ප්‍රශ්න විචාරාත්මක වැඩමුළු
- චිත්‍රතරගය
- විනෝදාත්මක වැඩසටහන් හා වෘත්තීය සුරක්ෂිතතාව පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

## මාධ්‍ය හමුව හා සේවය අතරතුර අත් පා අහිමිවු සේවකයන් නැවත සමාජගත කිරීමේ ව්‍යාපෘතිය

මාධ්‍ය හමුව සඳහා කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශයේ ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න අමාත්‍යතුමන් හා ගරු.රවීන්ද්‍ර සමරවීර රාජ්‍ය අමාත්‍යතුමන්ගේත් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ ලේකම් එස්.එම්.ජී. ජයරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් ඔක්තෝබර් මස 12 වන දින ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ ප්‍රධාන ශාලාවේදි ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් සුදානම් කරන ලද මාධ්‍ය හමුව සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යන්හි සහභාගිත්වයෙන් පවත්වන්නට යෙදුන අතර මේ සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වන චාන්දනි අමරතුංග මිය, කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්ත ස්වස්ථතා අංශයේ කොමසාරිස් රෝහිත ප්‍රනාන්දු මයා, ශ්‍රම වාසනා අරමුදලෙහි සාමාන්‍යාධිකාරි ඩී.ආර්. ජයලත් මයා සහ පෞද්ගලික අංශය නියෝජනය කරමින් විධායක නිලධාරින් පිරිසක්ද සහභාගි විය.

## සේවයේ යෙදි සිටියදි අනතුරටපත් සේවකයන් නැවත සමාජගත කිරීමේ ව්‍යාපෘතිය

අප හඳුනාගත් පරිදි ශ්‍රී ලංකාව තුල වසරකට කර්මාන්ත අංශය තුල සිදුවන අනතුරු හේතුවෙන් සේවකයන්ගේ ජීවිතහානි වීම් සිදුවන අවස්ථා හා දීර්ඝකාලිනව ඔත්පල වීම හෝ අත් පා අහිමි වීම සිදුවීම වැඩි වෙමින් පවති. මෙලෙස අත් පා අහිමි වි රැකියාව කරගෙන යාමට නොහැකි වු ඉතාමත් අසරණ තත්ත්වයට පත්ව සිටින දිළිඳු පවුල්වල සේවකයන් සඳහා ජීවිතයට අලෝකයක් සපයමින් ඔවුන්ගේ ජීවන කටයුතු පවත්වා ගැනිමට සහයෝගයක් ලබාදීම අරමුණු කරගෙන 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉදිරියට කරගෙන යාම සඳහා අප ආයතනය විසින් කෘතිම අත් පා ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදි.

මෙහිදි 2015 ඔක්තෝබර් මස 12 වන දින කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍ය ගරු. ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න අමාත්‍යතුමන් හා ගරු. රවීන්ද්‍ර සමරවීර රාජ්‍ය අමාත්‍යතුමන්ගේත් කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශ ලේකම් එස්.එම්.ජී. ජයරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ ප්‍රධාන ශාලාවේදි ඉතාමත් උත්කර්ෂවත් ලෙස පවත්වන්නට යෙදුනි. මෙහිදි එකි සේවක හා සේවකාවට කෘතිම පාදයන් ලබාදුනි.

මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ගේ මූල්‍ය දායකත්වය ලබාදුන් අතර කම්කරු වන්දි කොමසාරිස් ආයතනයේ සහයෝගයෙන් මේ සඳහා අත් පා අහිමි වූ සේවකයන් සොයාදීම සිදු කරන ලදි. ඔවුන් සඳහා ඉතාමත් වටිනා හා පහසු ආකාරයෙන් පාදයන් හා අත් නිර්මාණය කිරිම සිදු කිරිම  ආවාස පුද්ගලික සමාගම විසින් සිදුකරන ලදි.



## විශ්ව විද්‍යාල සිසුන් සඳහා සුරක්ෂිතතා හා සෞඛ්‍ය  වැඩමුළුව

ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් 2015 වෘත්තිය සුරක්ෂිතතා සතිය මුල් කරගෙන විශ්ව විද්‍යාල සිසුන් සඳහා සිදු කරන ලද සුරක්ෂිතතා හා සෞඛ්‍ය වැඩමුළුව සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් කලමණාකරණ පීඨයේ සිසුන්  සහ මොරටුව විශ්ව විද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු පීඨයේ සිසුන් සහභාගිවන ලදි. මෙය 2015 ඔක්තොබර් මස 13 වන දවස පුරා පවත්වන ලදි.




## ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණ

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය 2015 ඔක්තොම්බර් මස 14 වන දින කොළඹ ගලධාරී හෝටලයේදී පැවැත්විණි. මෙම සම්මන්ත්‍රණය වාර්ෂිකව පවත්වනු ලබන අතර ඒ සඳහා ශ්‍රී ලාංකික සේවා සේවක දෙපාර්ශවයම නියෝජනය කරමින් 450 කට නොවැඩි කර්මාන්ත හිමියන් සුරක්ෂිතතා නිළධාරීන් සහභාගී විය. එහිදී දේශීය හා විදේශීය සම්පත් දායකයන්ගේ හරවත් දේශන තුළින් තාක්ෂණික දැනුම ලබා දී ඇත.

මෙම වසරේ තේමාව වුයේ " නැගී එන වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ගැටළු" යන්නයි. මෙයට අනුව ගෝලිය වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ගැටළු සහ ඒවාට ගෝලිය වශයෙන් ගෙන ඇති පිළියම් සාකච්ඡා කිරිම සඳහා එනම් අපගේ කර්මාන්ත අංශයන් සමග වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය දැනුම බෙදාහදා ගැනිම සඳහා දේශකයන් ලෙස මැලේසියාව, කොරියාව හා සිංගප්පූරුව වැනි රටවල් නියෝජනය කරමින් සහභාගි විය.

මේ සඳහාද කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශයේ ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න අමාත්‍යතුමන් හා ගරු. රවීන්ද්‍ර සමරවීර රාජ්‍ය අමාත්‍යතුමන්ගේත් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ ලේකම් එස්.එම්.ජී. ජයරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් හා කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වන චාන්දනි අමරතුංග මිය ඇතුළු සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වයෙන් ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් සිදු කරන ලදි.





## ✦ ඩිප්ලෝමා සහතිකපත් ප්‍රධානෝත්සවය

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ඉතාමත් සාර්ථක ලෙස නිම කරන ලද විධායක ශ්‍රේණියේ රැකියාවල නියුතු හා නියැලීමට බලාපොරොත්තු වන සුරක්ෂිතතා නිළධාරින් සඳහා ඩිප්ලෝමාධාරින් ලෙස සහතිකපත් ලබාදීමේ ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය මෙම වසරේ ඔක්තෝබර් මස 14 වන දින ගාලුමුවදොර පිහිටි ගලධාරි හෝටලයෙහිදි මහත් උත්කර්ෂවත් අන්දමින් සිදු කරන ලදි. එහිදි වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව අවසන් කරන ලද 6 හා 7 වන කණ්ඩායම් සඳහා ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානය කරන ලදි.

මේ සඳහා ගරු ලේකම්තුමා කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය - එතුමා විසින් ප්‍රධානත්වය ගනු ලැබූ මෙහි ඊට අමතරව අප ආයතනය සමඟ කටයුතු කරන සමාගම් කිහිපයකම කළමණාකරුවන් කිහිප දෙනෙකුගේම සහභාගිත්වය මේ සඳහා ලැබුනි. මෙම උත්සවයේ තවත් කැපී පෙනෙන අංගයක් වූයේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පවත්වන්නට යෙදෙන පාඨමාලාවන් සඳහා සම්පත් දායකත්වය ලබාදෙන ලද දේශකවරුන් ඇගයීමටද අවස්ථාවක් කරගන්නා ලදි.



## ජපානයේ ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වෘත්තිකයින් පුහුණු කිරීමේ වැඩසටහන

ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා ජපානයට යන වෘත්තිකයින් පිරිසක් සඳහා වෘත්තිය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ දැනුම ලබාදීමේ ත්‍රෛයිමාසික නේවාසික පුහුණු වැඩසටහනක් ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේදි 2015 හි ඔක්තෝබර් මස සිට 2016 පෙබරවාරි මස දක්වා කණ්ඩායම් දෙකක් සඳහා පුහුණුව ලබාදෙන ලදි.



## වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ සමීක්ෂණය

ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයන් 3 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් විසින් වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ක්ෂේත්‍රයේ සමීක්ෂණය 2015 වර්ෂයේ ආරම්භ කරන ලදි. මෙහිදි,

1. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන හා ඉදිකිරීම් කර්මාන්තයේ කම්කරුවන් අතර වෘත්තීය අනතුරු වාර්තා කිරීම, හේතු තක්සේරු කිරිම
2. කොළඹ ලය (Chest Clinic) සායන සඳහා පැමිණෙන කර්මාන්ත අංශයේ කම්කරුගේ ප්‍රමාණය තක්සේරු කිරිම
3. පිළිකා රෝහල සඳහා පැමිණෙන කර්මාන්ත අංශයේ කම්කරුවන්ගේ ප්‍රමාණය

මෙම සමීක්ෂණය අප ආයතනය හා 3M ආයතනය හා එක්ව සිදු කරන ලදි. මේ වන විට මෙහි දත්ත අපගේ වෙබ් අඩවිය හරහා භාගත කරගැනිමටද හැකියාව පවති.

## වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය කළමනාකරණ පද්ධති පිළිබඳ කර්මාන්තයන් සඳහා උපදේශන සේවා

වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය කලමණාකරණ පද්ධති සංවර්ධනය සඳහා උපදේශන සේවා සැපයිම ද අප ආයතනය විසින් සිදු කරනු ලබයි. මෙම සේවාව සපයනු ලබන්නේ ආයතනයන්හි ඉල්ලිම්වලට අනුව විමද විශේෂයකි. එවැනි වැඩසටහන් 17 ක් පමණ මෙම වසර තුලදි ද සිදු කර ඇත.

## උපකරණ නිවැරදි භාවිතය පිළිබඳව උපදේශන සේවාව සැපයිම

රැකියා පිරිවිතරයන්ට අනුව පුද්ගල ආරක්ෂක උපකරණ නිසි භාවිතය පෙන්නුම් කිරීමට අවශ්‍ය මිනිස් ආකෘතින්  සංවර්ධනය සහ මෙම පෞද්ගලික ආරක්ෂක උපකරණ නිසි භාවිතය පිළිබඳ සේවකයන් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විමද අප විසින් සිදු කරනු ලබයි.







## දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන්

## NIOSH දෛනික වැඩ කටයුතු

ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ දෛනික වැඩකටයුතු සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය වැඩි දියුණු කිරීම හා සියලු වැඩ ස්ථානවල කම්කරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමේ අරමුණින් එහි පවත්වයි. **NIOSH** කටයුතු පහත සඳහන් පරිදි සිදුකරන අතර මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා,

**පාරිසරික සමීක්ෂණ වැඩසටහන :-**

කර්මාන්තයේ වැඩ කරන පාරිසරික ප්‍රමිතීන් සහතික කිරීමට එවැනි උෂ්ණත්වය, ආලෝකය, ශබ්දය, උණ වායු, ගෘහස්ථ වායු තත්ත්ව ලෙස වැඩකරන පාරිසරික උවදුරු මැනීම සඳහා වගකීම ගන්න. දැනට NIOSH 2015 වසර තුළ දී 150 කට වැඩි සේවා ස්ථාන පාරිසරික අධීක්ෂණ සේවා සැපයුම්කරුවකු ලෙස කර ඇත.

**වෛද්‍ය පරික්ෂණ** – ***NIOSH*** කර්මාන්තයේ අවශ්‍යතා අතරින් එකක් වන වැඩ කිරීමට යෝග්‍යතා ශ්‍රමිකයන් පිරිසක් සිටිද යන්න පරික්ෂා කර වෛද්‍ය වාර්තා ලබාදීම ආරම්භ කර ඇත. ඒ අනුව ***NIOSH*** ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ එනම්, ***BMI*** ගණනය**,** ශ්‍රවණ පරීක්ෂණ සහ පෙනහළු වල ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරිම, රුධිර පීඩනය පරීක්ෂා හා එකතු අනුපාත**,** අක්ෂි පරීක්ෂණ**,** රුධිර පරීක්ෂණ ආදි පරික්ෂණ මාලාවක් සිදු කිරිම අප ආයතනය විසින් සිදු කරනු ලබයි..

**අවදානම් ඇගයීම හා විගණන** – අප ආයතනය විසින් අවදානම ඇගයීම හා කාර්මික වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය විගණන පැවැත්වීම හා කර්මාන්තය තුළ ආබාධවලට ලක්වීම හැකිතාක් අවම කිරීමට උපදෙස් දීම හා නිර්දේශ හඳුනා ගැනීම හා සැපයීම මේ වන විට සිදු කරනු ලබයි.

## **2015 -** ඵලදායිතා සම්මාන සඳහා සූදානම් වීම

කර්මාන්තය අපේක්ෂා කරන හොඳම සේවා සැපයීම සඳහා NIOSH සැම විටම බලාපොරොත්තු වේ. එසේ NIOSH සිය අභ්‍යන්තර ධාරිතාව යාවත්කාලීන කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වේ. ඒ නිසා පහත සඳහන් ක්‍රියාකාරකම් ආයතනික දෘෂ්ටිය වැඩි දියුණු කිරීමට සිදු කරන ලදී.

• අප විසින් ආයතනය වෙත 5S සංකල්පය හඳුන්වාදීම

NIOSH අපගේ සේවාවන් වඩාත් ඵලදායී ලෙස ඉදිරිපත් කිරීමට හැකි විය. එහි සන්නිවේදන උපාය මාර්ග වෙනස් විය.




NIOSH වෙබ් අඩවිය සංවර්ධනය හා කර්මාන්ත ප්‍රජාව සමග සන්නිවේදනය වඩා කාර්යක්ෂම කිරීමට හැකි විය.

**2011 වසරේ සිට 2015 දක්වා NIOSH සේවා සැපයීම ප්‍රගතිය**






2011 දී කර්මාන්ත 33ක් පමණ ආවරණය වන පරිදි සේවා සැපයීම බස්නාහිර පළාතට සීමා විය




2012 දී කර්මාන්ත 60 ක් පමණක් ආවරණය වන පරිදි සේවා සැපයීම බස්නාහිර පළාත හා මධ්‍යම පළාතට සීමා විය







2013 දී කර්මාන්ත 90ක් පමණ ආවරණය වන පරිදි සේවා සැපයීම බස්නාහිර,මධ්‍යම, දකුණ, උතුරු මැද, වයඹ පළාතට ව්‍යාප්ත විය.

2014 - 2015 දී කර්මාන්ත 135 ක් පමණ ආවරණය වන පරිදි දිවයිනේ දිස්ත්‍රික්කයන් විශාල ගණනක් ආවරණය වන පරිදි අපගේ සේවාවන් ව්‍යාප්ත කිරිමට හැකි විය.

## ✦ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ අධ්‍යනය සඳහා වූ පුස්තකාලය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන පරිශ්‍රයේ බිම් මහලේ වෘත්තිය සුරක්ෂිතතාවය සම්බන්ධව ප්‍රයෝජනවත් පොත්පත් රාශියක් පුස්තකාලය සතුවේ. පහත සඳහන් විෂයන් පිළිබඳ පොත්පත් වාර සඟරා,පත්‍රිකා, වාර්තා, නිබන්ධන, පූර්ණ මුද්‍රණ, මොඩියුල,රසායනික ආරක්ෂණ දත්ත සටහන් පත්‍ර, දත්ත පාඨක පුවත් ලිපි ආදිය සම්බන්ධව අධ්‍යනය කරන සිසුන්ගේ පරිශීලනය සඳහා සතියේ දින වල විවෘතව ඇත.

- වෘත්තීය සෞඛ්‍යය
- කර්මාන්ත
- පාරිසරික
- මහජන
- වැඩ කිරීමට සුදුසු පරිසරය
- කාර්මික ආරක්ෂාව
- රසායනික ආරක්ෂාව
- වෘත්තීය රෝග
- කර්මාන්ත නීති සම්පාදනය
- විෂ විද්‍යාව
- ජලය සහ සනීපාරක්ෂාව

ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

ස්වයං මූල්‍ය පහසුකම් සලසාගන්නා ආයතනයක් ලෙස කටයුතු කිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ස්ථාපිත කරන ලදී. එය 2011 වසරේ සිට සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද අතර ඉතා සුළු කාර්ය මණ්ඩලය සමග රට පුරා සිය සේවා පුළුල් කිරීමට හැකි විය. මෙහිදි විශ්ලේෂණය වනුයේ ඉතාම කෙටි කාලයකින් අදාල අරමුණු හා ඉලක්ක කරා ලගාවීමට හැකිවීමයි. 2015 වන විට ආයතනය විසින් ලබ ඇති ශුද්ධ ලාභය මිලියන 70 ක් වන අතර මෙයය උපයා ඇත්තේ මෙහෙයුම් ආදායම් වලින් වීම විශේෂ කරුණකි.

## මූල්‍ය විශ්ලේෂණ 2014 - 2015

| | 2014 | 2015 |
|---|---|---|
| වෘත්තීය සුරක්ෂිතතා පාඨමාලා වලින් ලද ආදායම | 5,309,172.86 | 8,407,400.00 |
| පාරිසරික මිනුම් වලින් ලද ආදායම | 7,147,741.87 | 8,919,300.00 |
| වෙනත් ආයතනය සමග ඇතිකරගත් සහයෝගීතා ගිවිසුම් තුලින් සපයනු ලැබූ සේවා සඳහා ලබාගත් ආදායම | 4,058,228.94 | 2,077,484.00 |
| වෛද්‍ය පරීක්ෂණ කටයුතු තුළින් ලද ආදායම | 1,206,607.26 | 3,017,700.00 |
| ගොඩනැගලි කුලියට දීම තුළින් ලද ආදායම | 28,625.00 | - |
| පොළී ආදායම | 2,571,234.60 | 2,992,408.91 |
| වෙනත් ආදායම් | 61,574.00 | 61,022.00 |
| එකතුව | 20,383,184.00 | 25,475,314.91 |

ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව වර්තමාන මූල්‍ය තත්ත්වය පිළිබඳව සැලකිමේදි ආයතනය වත්කම් මිලියන 7 ක් වන අතර ආයතනය විසින් රු. මිලියන 46 ආයෝජනය කොට තිබීම සුවිශේෂී ලක්ෂණයකි. තවද ආයතනයයේ වගකිම වශයෙන් මිලියන 1.8 ක් දක්වා ඇතත් එයද අභ්‍යන්තර ආයතනවලට ඇති බැදීම්වීම විශේෂයකි. විගණන වාර්තාවකින්ද ඒ බව සඳහන් කොට ඇත.

## මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2015 දෙසැම්බර් 31 වන දිනට

**ශේෂ පත්‍රය**

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **වත්කම්** | | **රු.** | **රු.** |
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | **Note 1** | 753,803.60 | 3,042,876.75 |
| ලැබීම් | **Note 2** | 9,574,102.02 | 3,673,866.94 |
| සංවර්ධන අරමුදල | | 46,252,823.65 | 31,781,095.52 |
| | | 56,580,729.27 | 38,497,839.21 |
| **ස්ථාවර වත්කම්** | | | |
| භාණ්ඩාගාර තැම්පතු | | 267,500.00 | 267,500.00 |
| දේපල පිරියත හා උපකරණ | **Note 3** | 21,890,542.61 | 17,610,593.52 |
| | | 22,158,042.61 | 17,610,593.52 |
| **මුළු සංචිත** | | 78,738,771.88 | 56,375,932.73 |
| **වගකීම්** | | | |
| ජංගම වගකීම් | | | |
| ගෙවීම් | **Note 5** | 1,819,228.15 | 3,641,442.14 |
| මුළු වගකීම් | | 1,819,228.15 | 3,641,442.14 |
| **ශුද්ධ වත්කම්** | | 76,919,543.73 | 52,734,490.59 |
| අතිරික්ත ආදායම | **Note 4** | 59,862,816.71 | 52,734,490.59 |
| භාණ්ඩාගාර ලැබීම් | **Note 6** | 15,406726.97 | |
| වෛද්‍ය උපකරණ පරිත්‍යාග - ජාතික වෛද්‍ය අරමුදල | | 1,650,000.00 | |
| **මුළු ශුද්ධ වත්කම්** | | 76,919,543.68 | 52,734,490.59 |

## ආදායම් ප්‍රකාශය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආදායම් ප්‍රකාශය

| ආදායම | 2015 | 2014 |
|---|---|---|
| භාණ්ඩාගාර ලැබීම් | - | 10,973,676.59 |
| මෙහෙයුම් ආදායම | 29,523,539.91 | 20,383,184.53 |
| | 29,523,539.91 | 31,356,861.12 |

(-)

| වියදම් | | |
|---|---|---|
| ආයතන පරිපාලන වියදම් | 20,031,368.05 | 9,901,151.84 |
| මූල්‍ය වියදම් | 45,192.03 | 19,690.00 |
| ක්ෂය | 2,360,194.80 | 1,994,242.33 |
| **මුළු වියදම්** | 22,436,754.88 | 11,915,084.17 |
| | | |
| **වර්ෂයේ අතිරික්තය** | **7,086,785.03** | **19,441,776.95** |

## ගිණුම්වලට අදාළ සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

### 1 . වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

**1.1** වාර්තා කරන ආයතනය

ශ්‍රී ලංකාවේ කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ වන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 2005 අප්‍රේල් 28 වැනි දින ස්ථාපිත කරන ලදී. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, නිසි සෞඛ්‍ය හා ආරක්ෂිත පියවර පිළිබඳ දැනුවත්භාවය සහ බැදියාව වැඩි කිරීම තුළින් සියලු දෙනා සඳහා යහපත් වැඩ පරිසර තත්ත්වයන් ඇති කිරීමට කැපවී සිටියි. මෙම ආයතනය කොළඹ - 05, ජාවත්ත පාරේ අංක 97 දරන ස්ථානයේ පිහිටා තිබේ.

**1.2** ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

යෝග්‍ය සෞඛ්‍ය සහ ආරක්ෂණ නීතිරීති පිළිබඳ දැනුවත්භාවය සහ බැදියාව වැඩි කිරීම තුළින් සියලු දෙනා සඳහා යහපත් වැඩ පරිසර තත්ත්වයන් ඇති කිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කැපවී සිටියි. මෙම ක්‍රියාකාරකම්වලට යාවත්කාලීන කරනු ලැබූ තොරතුරු බෙදා හැරීම සහ උපදේශක හා උපදේශන සේවා ඇතුළත්වේ. මෙම ආයතනය මගින් සිදුකරනු ලබන පුහුණු කිරීම් තුළින් ප්‍රතිලාභ ලැබිය හැකි සේවායයන්, සේවකයන් හා වෙනත් සියලුම ගණයන්හි ජනතාව දැනුවත් කිරීම සහ පුහුණු කිරීම මෙන්ම වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ක්ෂේත්‍රයේ විමර්ශන අධ්‍යයන, සමීක්ෂණ සහ පර්යේෂණ සඳහා ආයතනය සහයෝගය දක්වයි.

**1.3** පිළියෙළ කිරීමේ පදනම

(අ) අනුකූලතා ප්‍රකාශය

මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශලවලට ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICASL) විසින් පනවා ඇති කුඩා ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට ( SLASSE) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට තිබේ.

(ආ) මිනුම් පදනම

ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට තිබේ. මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදුකර නැත.

(ඇ) සක්‍රිය සහ ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල්

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ආයතනික ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

## 2. දේපළ, පිරියත හා උපකරණ

### *i.* හඳුනාගැනීම හා මැනීම

භාණ්ඩ විෂයයන් දේපළ, පිරියත හා උපකරණ මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම සහ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිවීම්වලින් සිදුවන අලාභ පදනම් කරගෙනය. යන්ත්‍ර සූත්‍රයකට සහ උපකරණයකට අයත් භාණ්ඩ විෂයයක පිරිවැයට ඇතුළත් වන්නේ එය මිලදී ගත් වටිනාකම සහ එය අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා එකී වත්කම ක්‍රියාකරවීමට සෘජුව දරන ලද පිරිවැයයි.

කිසියම් දේපළකට, යන්ත්‍ර සූත්‍රයකට හෝ උපකරණයකට අයත් භාණ්ඩ විෂයයක උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම් වෙන වෙනම ගිණුම්ගතකොට තිබේ නම්, උපාංගය පිළිබඳව ඉදිරියට ගෙන යන කපාහළ වියදම්වලට ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. ඉන්ඉක්බිතිව කරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ දේපළ, පිරියත හා උපකරණවලට අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ එමගින් වැඩිවන්නේ නම් පමණි. සෙසු වියදම් දරනු ලැබූ පරිද්දෙන් වේ.

### *ii.* ක්ෂයවීම්

වත්කමේ ප්‍රයෝජනවත් ජීව කාලයට අනුව සෘජු රේඛා පදනමක් මත ආදායම් ප්‍රකාශය තුළ ක්ෂයවීම් හඳුනා ගැනේ.

ප්‍රවර්තන හා සංසන්දනාත්මක කාල සීමා සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජ්‍ය ආයුකාලයන් පහත දැක්වේ.

| | අවුරුදු |
|---|---|
| යන්ත්‍ර කට්ටල හා යන්ත්‍ර සූත්‍ර | 10 |
| පරිගණක උපකරණ | 5 |
| ලීබඩු සහ සවිකිරීම් | 10 |
| ශබ්ද පද්ධති අයිතම | 5 |
| වෛද්‍ය උපකරණ | 10 |
| වෙනත් වත්කම් | 10 |

මිලදී ගත් අවුරුද්ද තුළ ක්ෂයවීමක් සිදු නොකෙරෙන අතර අපහරණය කරන වර්ෂයේදී ඊට සම්පූර්ණ ක්ෂයවීමක් ඇතුළත් වේ.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්ර්ඩබ්/ඒ/එන්අයිඕඑස්එච්/එෆ්ඒ/2015 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2016 ඔක්තෝබර් 19 දින

සභාපති,

ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය.

**ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 17(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2016 මැයි 26 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි .

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01

ගිණුම්කරණ ප්‍රමිතියක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකල යුතු නමුත් ජපන් පුහුණු වැඩසටහන වෙනුවෙන් ඉදිරි වර්ෂය සඳහා ලැබී තිබූ රු.166,000 ක් ලැබිය යුතු ගිණුම් වල ශේෂයෙන් අඩුකර දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාඨමාලා ආදායම් හඳුනා ගැනීමේදී ආයතනය විසින් අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඩිප්ලෝමා පාඨමාලා ආදායම තුළ ඉකුත් වර්ෂය හා ඉදිරි වර්ෂය වෙනුවෙන් ලද රු. 2,000,000 ක පාඨමාලා ගාස්තු ඇතුළත් කර තිබුණි.

(ආ) රාජ්‍ය ප්‍රදාන ගිණුම් තැබීම සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබූ අතර, ඉකුත් වර්ෂය දක්වා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය හරහා ආයතනය වෙත ලැබුණු පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන සියල්ලම අයභාර ආදායමක් ලෙසත්, සමාලෝචිත වර්ෂයේ දී එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකමක් ලෙසත් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය ප්‍රතිපූර්ණය කරන ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් රු.610,677 ක් හා රු.4,913,270 ක් සහ සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපූර්ණය කලයුතු පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් රු.3,421,259 ක් හා රු.585,885 ක් නියමිත පරිදි හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

2009 හා 2010 වර්ෂවලදී විවිධ ආයතන වලින් ලැබී අමාත්‍යාංශය වෙත යවන ලද රු.267,500 ක් මහා භාණ්ඩාගාරය වෙත යවා ඇති නමුත් එය ආයතනයේ ගිණුම්වල තැන්පත් ලෙස ගිණුම්ගත කර තිබුණද එය මහා භාණ්ඩාගාරය මගින් තහවුරු කර නොතිබුණි.

**2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

2014 ජනවාරි සිට 2015 දෙසැම්බර් දක්වා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායකත්වය වූ රු.143,151 ක් සහ කම්කරු දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කළ යුතු රු.1,170,961 ක මුදල විගණන දිනය වූ 2016 මැයි 04 දින වන විටත් අදාළ ආයතන වෙත නිරවුල් කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම්**

2014 ඔක්තෝබර් 17 දිනැති 2/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි සෑම වර්ෂයකම මාර්තු 31 දිනට ප්‍රථම පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතු වුවත් විගණන දිනය වූ 2016 මැයි 04 දින දක්වාම 2015 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,086,785 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.19,441,777 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,354,992 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. භාණ්ඩාගාර පුනරාවර්තන ලැබීම් ගිණුම්ගත කිරීමේදී ඉකුත් වර්ෂවලදී අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ එකතුව රු.15,406,726 ක පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනා නොගැනීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වන මූල්‍ය අතිරික්තයක් පෙන්නුම් කෙරුණි. 2014 හා 2015 වර්ෂවල රාජ්‍ය ප්‍රදාන ගිණුම් තැබීමේ සංගතභාවයක් නොතිබීම මත 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික, දේපල පිරියත උපකරණ සඳහා වන ක්ෂය හා රාජ්‍ය බදු සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු.4,767,579 ක්වූ ආයතනයේ දායකත්වය 2014 වර්ෂය දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. 2014 වර්ෂයේදී රු.27,381,220 ක්වූ දායකත්වය 2015 වර්ෂයේදී සියයට 42 කින් පිරිහීමක් නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත ප්‍රකාරව ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ සියළු ක්‍රියාකාරකම් වලදී අදාළ අමාත්‍යවරයාට සහාය වීම, අවශ්‍ය වන අධ්‍යයන පර්යේෂණ සහ විශ්ලේෂණ සිදු කිරීම හා වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍ය සහ සුභසාධනය පිළිබඳ අධ්‍යාපනය, පුහුණු කිරීමේ සහ දැනුවත් කිරීමේ සියළු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආයතනයේ ප්‍රධාන පරමාර්ථ විය.

සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් ඉටුකරගත යුතු කාර්යයන් හා ඒවා ඉටු කිරීමේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම්කර තිබූ පාඨමාලා 03 ක් පවත්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී උක්ත ආයතනයේ පරමාර්ථ අතරින් බොහොමයක් පරමාර්ථ ඉටුකර ගැනීම පිළිබඳව ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ආයතනය ආරම්භයේ සිට ඩිප්ලෝමා පාඨමාලා 2ක් සහ සහතික පත්‍ර පාඨමාලා 03ක් පවත්වා සහතික පත්‍ර ප්‍රදානය කරන නමුත් එම පාඨමාලාවන් අයදුම්කළ සහ සාර්ථක ලෙස නිමකර සහතික පත්‍ර හිමිකරගත් ශිෂ්‍යයන් පිළිබඳ දත්ත පද්ධතියක් නඩත්තු කර නොතිබූ බැවින් නිකුත් කළ සහතික පත්‍ර තහවුරු කිරීමකදී ආයතනය යම් අසීරුතාවයකට පත්වීමට ඉඩකඩ පවතින බවත් මේ තුලින් වංචාවක් සිදුවීමකට ඉඩකඩ පවතින බවත් නිරීක්ෂණය විය.

### 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ සංවර්ධන කටයුතු සඳහා වර්ෂ 10 ක කාලයක සිට එකතුව රු. 5,644,437 ක් වැයකර තිබුණද එම ගොඩනැගිල්ලේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සැලැසුම් කළ ඉලක්ක ගත ආදායම වැඩිවීමට ප්‍රධාන වශයෙන් පාඨමාලා ගාස්තු වැඩි කිරීම හේතු වී තිබූ අතර ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

ආයතනය විසින් සිදුකරන ලද පාරිසරික මිනුම් පරීක්ෂාවන් සඳහා සම්පත් දායකත්වය සැපයීම වෙනුවෙන් ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාවේ නිර්දේශය සමඟ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශයේ අනුමැතියකින් තොරව රු.166,500 ක් ගෙවා තිබුණි.

## 4.5 කාර්යමණ්ඩල පරිපාලනය

ජ්‍යෙෂ්ඨ හා තෘතීක මට්ටමේ නිලධාරීන් 06 දෙනෙකු ඇතුළු නිලධාරීන් 14 දෙනෙකු සඳහා පුරප්පාඩු පැවති අතර මෙම බඳවාගැනීම් සිදු නොකිරීම තුලින් ආයතනයේ අරමුණු නිසිපරිදි ඉටුකරගැනීමේ දුෂ්කරතාවයන් සිදු විය හැකිය. මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් පසුගිය වර්ෂවලදී ද විගණනයෙන් පෙන්වා දී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 උපවගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද එය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) පරිදි එය මාස හයකට නොවැඩි කාලයක් තුළ යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 හා 3.6 වගන්ති සංශෝධනයට අදාල 2014 ජූලි 04 දිනැති අතිරේක 28 පරිදි මිල සැඳහුම් ක්‍රමය යටතේ අවම වශයෙන් මිල කැඳවුම් තුනක් ලබාගෙන මිලදී ගැනීම සිදුකල යුතු, රු.214,000 ක්වූ ප්ලාස්ටික් පුටු හා මේස මිලදී ගැනීමේදී ඊට පටහැනි ලෙස එක් මිල කියුමක් පදනම් කරගෙන මිලදී ගැනීම් සිදුකර තිබුණි.

**5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ - 18 වගන්තිය පරිදි ආයතනයේ 2013 හා 2014 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තාවන් සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | මෙහෙයුම් පාලනය | - | සැලැසුම් කළ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ප්‍රමාණවත් උපාය මාර්ග භාවිතා නොකිරීම. |
| (ආ) | අයවැය ලේඛනමය පාලනය | - | අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස භාවිතා නොකිරීම. |
| (ඇ) | කාර්යමණ්ඩල පරිපාලනය | - | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඈ) | ස්ථාවර වත්කම් පරිපාලනය | - | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති.